ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1871/38 - 2014 ජූලි මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2014.07.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය : 01/10/03/04

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම්

ඌව පළාත් ආණ්ඩුකාරවර ගරු සී. නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම් සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරී ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා මහතා, 2014.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) තනතුරේ වැඩ බැලීමට,

02. ඌව පළාත් මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (අයවැය) ආර්. ටී. එස්. එල්. ජයසිංහ මහතා, 2014.03.26 දින සිට 2014.04.06 දින දක්වා විදේශ ගත වන බැවින්, 2014.03.26 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරී ඩබ්ලිව්. වී. පී. නන්දපාල මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (අයවැය) තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

03. ඌව පළාත් සභාවේ යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලි බල හා බල ශක්ති සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා මහතා 2014.03.26 දින සිට 2014.04.06 දින දක්වා විදේශ ගත වන බැවින්, 2014.03.26 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරී ජී. කේ. එස්. එල්. රාජදාස මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් සභාවේ යෞවන කටයුතු, ක්‍රීඩා, සමාජ සුභසාධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, විදුලි බල හා බල ශක්ති සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

04. ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) (වැ. බ.) ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා මහතා 2014.03.26 දින සිට 2014.04.06 දින දක්වා විදේශ ගත වන බැවින්, 2014.03.26 දින සිට ඒ මහතා නැවත දිවයිනට

1A - PG 2112 — 50 (2014/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පැමිණෙන තෙක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ නිලධාරී ජී. කේ. එස්. එල්. රාජදාස මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) තනතුරේ රාජකාරී ආවරණය කිරීමට.

05. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශ්‍රාමික ආයුර්වේද වෛද්‍ය එම්. ඩී. ජී. එල්. බැසිල් කරුණාරත්න මහතා, 2014.02.27 වැනි දින සිට බිබිල මැදගම දිස්ත්‍රික් ආයුර්වේද රෝහලේ, වෛද්‍ය අධිකාරී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2015.02.28 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

06. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I වැනි පන්තියේ පශු වෛද්‍ය නිලධාරී විශේෂඥ එම්. ජී. සනත් ගමගේ මහතා, 2014.05.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ (බදුල්ල) වශයෙන් පත්කිරීම,

07. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II/I වන ශ්‍රේණියේ නිලධරී ආර්. එස්. සී. ඩබ්ලිව්. එම්. ජේ. බී. එම්. විජයතුංග මහතා, 2014.05.02 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

08. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I වන පන්තියේ නිලධාරී පශු වෛද්‍ය එස්. කේ. වීරසුන්දර මහතා. 2014.05.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යක්ෂ වශයෙන් පත්කිරීම,

09. ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 07 දරන ඌව පළාත් ක්‍රීඩා ප්‍රඥප්තියේ 03 ඡේදය ප්‍රකාරව, ගීතා නන්දනී පතිණවසම් මහත්මිය, 2014.05.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුරේ පූර්ණ කාලීනව රාජකාරී ඉටුකිරීමට,

10. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නොවන ඉංජිනේරු සේවයේ විශ්‍රාමික නිලධාරී එස්. ටී. තෙන්නකෝන් මහතා 2014.05.04 වැනි දින සිට ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2014.11.03 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

11. ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ එස්. ටී. තෙන්නකෝන් මහතා, 2014.05.14 වැනි දින සිට 2014.05.15 වැනි දින දක්වා විදේශ ගතවන බැවින්, 2014.05.14 වැනි දින සිට එම මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරී, එම්. ටී. ජී. ඒ. එන්. ලක්මාල් මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කරීමට,

12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ නිලධාරී ඩී. එම්. එන්. දිසානායක මහතා, 2014.05.26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, බණ්ඩාරවෙල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ රාජකාරී ඉටු කිරීමට,

13. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන පන්තියේ නිලධාරී කේ. ඒ. බී. සෙනෙවිරත්න මහතා, 2014.06.09 වැනි දින සිට මාස තුනක කාලයක් සඳහා ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

14. වෛද්‍ය එම්. කේ. ඩී. සේනානායක මහත්මිය, 2014.02.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වශයෙන් පත් කිරීම.

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්,

බදුල්ල, රජවීදයේ,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

08-154

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.